ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2072/15 - 2018 මැයි මස 21 වැනි සඳුදා - 2018.05.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

**(262 අධිකාරය)**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ පහල වල්පොල ගමරාලලාගේ චමින්ද අයත් වන්නා වූ ජනතා විමුක්ති පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වසන්ත රෝයි මුණසිංහ නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද;

අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී රවීන්ද්‍ර සුභාෂණ වෙදගේ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් වසන්ත රෝයි මුණසිංහ, අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

රවීන්ද්‍ර සුභාෂණ වෙදගේ,
තේරීම්භාර නිලධාරී,
අඟුණකොලපැලැස්ස ප්‍රාදේශීය සභාව.

2018 ක් වූ මැයි මස 17 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
හම්බන්තොට.

06 - 348

1A - G 27705 - 17 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*